# කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාව

# අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් කෘෂිකර්මාන්තයට සම්බන්ධ දර්ශනවේදී උපාධි සුදුසුකම් හා පරිපාලන පළපුරුද්ද සහිත වයස අවුරුදු 63 ට අඩු විශ්වවිද්‍යාල හා අනෙකුත් ජාතික හා ජාත්‍යන්තර ආයතන සමග වැඩ කිරීමේ හා සම්බන්ධතා ඇති කර ගනිමින් අධ්‍යයන නායකත්වය සැපයිය හැකි, අධ්‍යයන පරිසරයක් තුළ රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන අන්තර් පුද්ගල කුසලතා සහ ආයතනය පිළිබඳ කැපවීමක් හා අවබෝධයක් ඇති පුද්ගලයෙකු විය යුතුය. කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යවස්ථාවට අනුව අධ්‍යක්ෂවරයා පූර්ණ කාලීන නිලධාරියෙක්, ප්‍රධාන විධායක නිලධාරියෙක්, ප්‍රධාන අධ්‍යයන නිලධාරියෙක් සහ ආයතනයේ ගණන්දීමේ නිලධාරියා ද වේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ හා සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා මෙන්ම ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ ද සාමාජිකයෙකි. ඔහු / ඇය අධ්‍යක්ෂ ධුරයට පත්වූ දින සිට වසර තුනක කාලයක් සඳහා හෝ වයස අවුරුදු 65 සම්පූර්ණ වන තෙක් හෝ තනතුරේ කටයුතු කළ හැක.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය පිළිබඳ එකම පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය වන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය පසුගිය වසර 50 තුළ විවිධ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි වේගයෙන් ව්‍යාප්ත වී තිබේ. රටේ ආර්ථික සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම සඳහා කෘෂිකාර්මික අංශයේ පුරෝකථනය කර ඇති වෙනස්කම් වලට අනුකූලව සිය අධ්‍යයන වැඩසටහන් තවදුරටත් පුළුල් කිරීමට හා විවිධාංගීකරණය කිරීමට සහ පුළුල් ක්‍රියාකාරකම් කිහිපයක් ආරම්භ කිරීමට ආයතනය අපේක්ෂා කරයි.

මෙම අභියෝගයන්ට මුහුණ දීම සඳහා දැක්මක් ඇති හොඳ අධ්‍යයන පසුබිමක් සහ පර්යේෂණ හා කළමනා කරණයේ විශිෂ්ට වාර්තාවක් ඇති පුද්ගලයකු කළමනා කරණ මණ්ඩලය අපේක්ෂා කරයි.

අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් සමග, උපන්දිනය ඇතුළත් සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව, ආයතනයේ සංවර්ධනය සඳහා තම දැක්ම සඳහන් ප්‍රකාශයක් සහ අදාළ තනතුරට පත් කරනු ලැබුවහොත් ඉටු කිරීමට අපේක්ෂා කරන කරුණු පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් 2026.09.11 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරී, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පරණ ගලහා පාර, පේරාදෙණිය වෙත එවිය යුතුය. නැතහොත් එදිනට හෝ ඊට පෙර ආයතනය වෙත භාර දිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂ තනතුර, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය"** යන්න සඳහන් කළ යුතුය. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු නම්, ඔහු/ ඇය එම තනතුරට පත් කළහොත් සේවයෙන් නිදහස් කළ හැකිද යන්න සඳහන් සේවා යෝජකයාගේ ලිපියක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

වැඩිදුර තොරතුරු විමසීම සඳහා නියෝජ්‍ය ලේඛකාධිකාරී, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (දුරකථන අංක **081-2388203**) හෝ ආයතනයේ වෙබ් අඩවියට පිවිසෙන්න (**www. pgia.ac.lk**).

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය.**
**2026.08.12**